**ශීර්ෂය 194 - විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2016 වර්ෂය**

---------------------------------------------------------------------------------------------------------------------------

ශීර්ෂය 194 - විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 16 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

--------

### 2.1 විසර්ජන ගිණුම

--------------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

------------------------------

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 1,577.17 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 995.71 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 581.46 ක් හෙවත් සියයට 36.87 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 133.31 | 130.63 | 2.68 | 2.01 |
| මූලධන | 1,443.86 | 865.08 | 578.78 | 40.09 |
| එකතුව | 1,577.17 | 995.71 | 581.46 | 36.87 |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශයට අදාල විෂය අංක 19401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 3.00 | 2.05 | 0.50 | 1.57 | 7.50 | 5.30 |

## 2.3 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0419/0016/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු. මිලියන 0.0072 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය යටතේ වූ තැන්පත් ගිණුම් 02 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු. මිලියන 0.27 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0001/0113/000 | 0.19 |
| 6000/0000/00/0013/0110/000 | 0.08 |
| එකතුව | 0.27 |

## 2.5 විගණන නිරීක්ෂණය

විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 විසර්ජන ගිණුම

#### 3.1.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාහන මිලදී ගැනීම සඳහා රු. මිලියන 105 ක ප්‍රතිපාදන වෙන්කර ගෙන තිබුණද එයින් රු. මිලියන 104.95 ක් ඉතිරි වී තිබුන අතර ඉතිරිය ප්‍රතිපාදනයෙන් සියයට 99.95 ක් විය. වාහන මිලදී ගැනීමේ ප්‍රමාණයන් හා අවශ්‍යතාවයන් වරින් වර සංශෝධනය වීම හා ප්‍රසම්පාදන කටයුතු වසර අවසානයේ සිදු කිරීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි.

(ආ) වැය විෂයයන් 18 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය, එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 සිට සියයට 92 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) සැලසුම් කළ පරිදි කටයුතු නොකිරීම හේතුවෙන් ව්‍යාපෘති 04 ක ප්‍රගතිය පහල අගයක් ගෙන තිබුණි. ඒ හේතුවෙන් ඒ සඳහා ලබා දුන් ප්‍රතිපාදනයෙන් සියයට 23 සිට සියයට 55 දක්වා ප්‍රතිශතයක් එනම් රු. 469,124,114 ක් ඉතිරි වී තිබුණි.

**3.2 බේරුම් නොකළ බැරකම්**

**ඉතිරිය ඉක්මවා බැරකම්වලට බැඳීම**

මුදල් රෙගුලාසි 94(2) විධිවිධාන ප්‍රකාරව ඉඩදී තිබූ සීමාව ඉක්මවා වැය විෂයයන් 11 ක් සඳහා රු. 1,999,889 ක් වූ බැරකම්වලට එළඹ තිබුණි.

**3.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**අභ්‍යන්තර විගණනය**

2016 වර්ෂය තුළදී අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණ බැවින් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**3.4 කාර්යසාධනය**

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**3.4.1 ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

**(අ) පාසල් පරිගණක විද්‍යාගාර ව්‍යාපෘතිය**

2016 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිතව පැවති පාසල් පරිගණක විද්‍යාගාර ව්‍යාපෘතියේ ප්‍රගතිය පහත දැක්වේ.

(i) මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 250 ක ප්‍රතිපාදන සළසා තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. මිලියන 146.37 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු. මිලියන 103.63 ක් ඉතිරිව තිබෙන අතර එය ව්‍යාපෘතිය සඳහා සළසා තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 41.45 ක් විය.

(ii) ව්‍යාපෘතියේ අදියර 1 යටතේ දැනට පවතින පාසල් පරිගණක විද්‍යාගාර 45 ක් සඳහා පරිගණක උපාංග සැපයීමට සැළසුම කර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාසල් පරිගණක විද්‍යාගාර 38 ක් සඳහා පමණක් අවශ්‍ය සියළු පරිගණක හා පරිගණක උපාංග ලබා දී තිබුණි. ඊට අමතරව පාසල් පරිගණක විද්‍යාගාර 06 ක් සඳහා පරිගණක උපාංග කීපයක් පමණක් ලබා දී තිබුණි.

(iii) 2016 වර්ෂය තුළදී අදියර II යටතේ නව පරිගණක විද්‍යාගාර හා නව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන 59 ක් පිහිටුවා තිබූ නමුත් ස්ථාපිත කිරීමට බලාපොරොත්තුවන ප්‍රමාණය කොපමණද යන්න සැළසුම් කර නොතිබුණි.

(iv) 2016 වසර තුළ ස්ථාපිත කළ පරිගණක විද්‍යාගාර 59 න් 30 ක් ලබා දී තිබුණේ බදුල්ල දිස්ත්‍රික්කය සඳහා වූයෙන් සම්පත් බෙදාදීමේ විෂමතාවයක් විය.

(v) ස්ථාපිත කරන ලද පරිගණක විද්‍යාගාර සඳහා 2016 වසරේ ගුරුවරුන් 500 ක් පුහුණු කිරීමට යෝජිතව තිබුණු නමුත් ගුරුවරුන් 432 ක් පමණක් පුහුණු කර තිබුණි.

(ආ) **දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන**

---

2014 වර්ෂයේ ආරම්භ කර තිබුණු දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ දිවයින පුරා දිස්ත්‍රික් තොරතුරු මධ්‍යස්ථාන 25 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව පරිගණක තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන 06 ක් ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් කිසිදු තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කර නොතිබුණි.

(ii) 2014 වර්ෂයේ සිට අවිච්ඡේදව පැවති අම්පාර, කළුතර, පුත්තලම, ගාල්ල, මාතලේ, කෑගල්ල, වවුනියාව හා බදුල්ල යන ස්ථානවල දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන 08 ක් ස්ථාපිත කිරීමට සමාලෝචිත වර්ෂය තුළ දී රු.19,020,732 ක් වටිනා පරිගණක හා අනෙකුත් උපකරණ සඳහා ලබා දී තිබුණි. එසේ වුවද කෑගල්ල, ගාල්ල, බදුල්ල හා මාතලේ යන දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන විගණන දිනය වූ 2017 මැයි 05 දින විටත් ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතිණි. වව්නියාව, අම්පාර, පුත්තලම හා කළුතර තොරතුරු මධ්‍යස්ථානවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්ට අවබෝධයක් ලබාදී නොමැති බවද විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) **තොරතුරු තාක්ෂණ උද්‍යාන පිහිටුවීම**

---

ප්‍රාදේශීය ජනතාවගේ තොරතුරු තාක්ෂණ දැනුම දියුණු කිරීමේ අරමුණ ඇතිව යාපනය හා මන්නාරම පිහිටුවා ඇති තොරතුරු තාක්ෂණ උද්‍යාන සඳහා වාර්ෂිකව පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා අමාත්‍යාංශය විසින් අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) **යාපනය තොරතුරු තාක්ෂණ උද්‍යානය**

---

- 2013 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා මෙම තාක්ෂණ උද්‍යානය සඳහා රු. මිලියන 27.98 ක් වැයකර තිබුණු අතර රු. 953,489 ක ආදායමක් ලැබී තිබුණි. වියදමට සාපේක්ෂව ආදායම සියයට 3.4 ක් විය.

- සමාලෝචිත වර්ෂය සඳහා පාඨමාලා 13 ක් යටතේ සිසුන් 245 ක් පුහුණු කිරීමට සැලසුම් කළද පාඨමාලා දෙකකට සිසුන් 81 ක් පමණක් සහභාගී වී තිබුණි. තවද 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය සඳහා පරිගණක පුහුණුව 525 දෙනෙකුට පමණක් ලබා දී තිබුණි.

(ii) **මන්නාරම තොරතුරු තාක්ෂණ උද්‍යානය**

-----------------------------------------

2013 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා මෙම තාක්ෂණ උද්‍යානය සඳහා රු. මිලියන 17.7 ක් වැයකර තිබුණ අතර පරිගණක පුහුණුව 868 දෙනෙකුට ලබා දී තිබුණි. එසේම මෙම කාල පරිච්ඡේදය සඳහා රු. 3,127,774 ක ආදායමක් ලබාගෙන තිබුණද එය වියදමට සාපේක්ෂව සියයට 17.68 ක් විය.

(ඇ) **ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය**

-----------------------------------------------------------------------

**(i) පිහිටුවීම**

----------

- ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය ශ්‍රී ලංකා රජයට පූර්ණ වශයෙන් අයත් සමාගමක් ලෙස වසර 05 ක කාලයක් සඳහා 2003 අංක 27 දරන තොරතුරු, හා සන්නිවේදන තාක්ෂණ පනත යටතේ 2003 මැයි 18 වන දින පිහිටුවා තිබුණි. 2003 ජූලි මස 16 දින ආයතනයේ මූල්‍ය හා පරිපාලනමය කටයුතු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය තීරණයක් ගෙන තිබුණ අතර එමඟින් සමාගමට පූර්ණ ස්වාධීනත්වයක් ලබාදී තිබුණි. වසර 05 ක කාලය නිමාවීමෙන් පසු ආයතනයේ කටයුතු අඛණ්ඩව පවත්වා ගෙනයාමට 2008 අංක 33 දරණ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (සංශෝධන) පනත ක්‍රියාත්මක කර තිබුණ ද උක්ත තීරණය සංශෝධනය කර නොතිබුණි.

- මුල් කාලය තුල "ඊ ශ්‍රී ලංකා ව්‍යාපෘතිය", ලෝක බැංකුව, කොරියානු EXIM බැංකුව සහ අනිකුත් සංවර්ධන සහාය ආයතන කිහිපයක් මගින් අරමුදල් සැපයීමෙන් ක්‍රියාත්මක වුවද වර්තමානයේදී සම්පූර්ණයෙන්ම රජයේ අරමුදල් මත ක්‍රියාත්මක වේ. එසේ වුවද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය අමප/03/0884/134/027 හා 2003 ජූලි 09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි 2017 සැප්තැම්බර් 30 දින දක්වාම පූර්ණ ස්වාධිනත්වයකින් කටයුතු කරන අතර රජයේ නීති, රීති, රෙගුලාසි අනුගමනය කර නොතිබුණි.

- 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි විධිවිධානවලින් බැහැරව නියෝජිතායතනය වෙනුවෙන් අනුමත කාර්යය මණ්ඩලයක් හා අනුමත බඳවා ගැනීමේ පරිපාටියක් නොමැතිව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නියෝජිතායතනයේ පරිපාලන හා මූල්‍ය අංශය ඇතුළු සියළුම නිලධාරීන්, උපදේශකවරුන් හා සේවයක් ලෙස 187 දෙනෙකු කොන්ත්‍රාත් පදනම බඳවා ගෙන තිබුණි.

- 2003 අංක 27 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත හා 2008 අංක 33 දරන සංශෝධන පනතට අනුව පිහිටුවිය යුතු අන්තර් අමාත්‍යාංශ කමිටුව වසර 12 ක ප්‍රමාදයකින් පසුව 2015 ඔක්තෝම්බර් 16 දින පිහිටුවා තිබුණි.

(ii) **කාර්යසාධනය**

----------------

- නියෝජිතායතනය මගින් 2016 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා 55 ක් සඳහා අනුමැතිය ලැබී තිබුණ අතර ඒ සඳහා ලබාදුන් ප්‍රතිපාදනය රු.මිලියන 963 ක් විය. මෙම ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දරා ඇති වියදම රු.මිලියන 651 ක් විය. මෙම වියදම තුළ නිලධාරීන් සඳහා ගෙවූ වැටුප් වියදම රු.210,811,111 ක් වූයෙන් එය ව්‍යාපෘති වියදමින් සියයට 32 ක් විය. එසේ වුවද 2016 වර්ෂය සඳහා වූ නියෝජිතායතනයේ මූල්‍ය ප්‍රකාශන 2017 සැප්තැම්බර් 30 දින වනවිටත් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් නිලධාරීන්ට ගෙවා ඇති සම්පූර්ණ පාරිශ්‍රමික මුදල කොපමණද යන්න අනාවරණය කර ගත නොහැකි විය.

- එම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සැලකිය යුතු ලෙස පහළ මට්ටමක පැවති අතර ඊ ස්වාභිමානී නම් වූ ජාතික සම්මාන ප්‍රදාන උළෙල පමණක් සියයට සියයක ප්‍රගතියක් අත් කරගෙන තිබුණි. ඉතිරි ව්‍යාපෘති 54 න් ව්‍යාපෘති 07 ක් සියයට 61-96 දක්වා වූ ප්‍රගතියක්ද ව්‍යාපෘති 27 ක් සියයට 31-60 දක්වා වූ ප්‍රගතියක්ද ව්‍යාපෘති 20 ක් සියයට 0-30 දක්වා වූ ප්‍රගතියක්ද අත්කරගෙන තිබුණි.

- ව්‍යාපෘතීන් සැලසුම් කළ ආකාරයෙන් ක්‍රියාත්මක නොවීමට බලපා තිබූ හේතු අතරින් ප්‍රධාන වශයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාද වීම් බලපා තිබුණි.

**3.5 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**අක්‍රීය බැංකු ගිණුම්**

අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලැබූ බැංකු ගිණුමක රු. 200,500 ක ශේෂයක් වූ අතර 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 කාලයක් තිස්සේ මෙම ගිණුම අක්‍රීයව පැවතුණි.

**3.6 අවිධිමත් ගනුදෙනු**

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

**(අ) අමාත්‍යවරයාගේ නිලනිවස අළුත්වැඩියා කිරීම**

රාජ්‍ය සංස්ථාවක් වෙතින් මෙම අළුත්වැඩියා සඳහා රු. 3,780,804 ක ඇස්තමේන්තුවක් ලබා දී තිබුණි.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 1.2 හා 3.2.1 මාර්ගෝපදේශ අනුව මිල ගණන් නොකැඳවා වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය මගින් මිල ගණන් කැඳවා තිබුණි.

(ii) නිලනිවස අළුත්වැඩියාව සඳහා කොන්ත්‍රාත්කරුවන් 08 දෙනෙකුගෙන් මිල ගණන් කැඳවූ බවට සටහන් කර තිබුණද ඒ බව පිළිගැනීමට සාක්ෂි නොවීය.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 8.5.1 මාර්ගෝපදේශයට අනුව තෝරාගත් ලංසුකරු පිළිබඳ තීරණය අනෙක් ලන්සුකරුවන් වෙත ලිඛිතව දැනුම් දී නොතිබුණි.

(iv) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 2.12 මාර්ගෝපදේශයට අනුව තාක්ෂණික කමිටුවට පත්වන සමාජිකයන්ගෙන් ප්‍රකාශය (Declaration) ලබා ගෙන නොතිබුණි.

(ආ) **පාසල් පරිගණක විද්‍යාගාර හා දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථාන ව්‍යාපෘති සඳහා පරිගණක හා උපාංග මිලදී ගැනීම**

**-----------------------------------------------------------------------------------------------**

මෙම ව්‍යාපෘති සඳහා රු. 66,865,350 ක් ලෙස අවම මිල ඉදිරිපත් කළ ආයතනය පරිගණක හා අනෙකුත් උපාංග සඳහා සියළු සුදුසුකම් සපුරා තිබියදී Scanner හා Multimedia Projectors සඳහා පමණක් අවශ්‍ය අවුරුදු 05 ක හා අවුරුදු 03 ක පලපුරුද්ද නොමැතිකම හේතුවෙන් ප්‍රතික්ෂේප කර එම ආයතනයට වඩා රු. 2,502,750 ක් වැඩියෙන් මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනයක් තෝරා ගෙන තිබුණි.

## 3.7 අනාර්ථික ගනුදෙනු

**-----------------------**

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජනාධිපති ලේකම්ගේ CA/1/17/1 හා 2010 මැයි 14 දිනැති චක්‍රලේඛයේ 1 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශ හා ඒ යටතේ පවතින සියළුම ආයතනයන්හි කාර්යාල හැකිතාක් දුරට රජයේ හෝ රාජ්‍ය සංස්ථාවලට අයත් ගොඩනැගිලිවල පවත්වා ගත යුතුය. එසේ වුවත් 2010 වර්ෂයේ සිට මෙම අමාත්‍යාංශය සඳහා දිගින් දිගටම කාලය දීර්ඝ කරමින් පෞද්ගලික ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ගෙවා ඇති බදු කුලිය රු. 18,689,666 ක් විය. රජයේ ගොඩනැගිලි සොයාගැනීමට අසීරු වූ බැවින් 2010 වර්ෂයේ සිට අමාත්‍යාංශය පෞද්ගලික ගොඩනැගිල්ලක් කුලියට ගෙන පවත්වා ගෙන යාමට සිදුව ඇති බව ලේකම්වරයා විසින් දන්වා ඇත.

(ආ) 2012 ජූලි 04 දින පැවැති රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නියෝගයට අනුව කාර්යාල ගොඩනැගිල්ල සඳහා දරා ඇති අධික වියදම් පාලනය කරගැනීම පිණිස කාර්යාල ගොඩනැගිල්ල මාස 06 ක කාල සීමාවක් ඇතුලත වෙනත් සුදුසු ස්ථානයක ස්ථාපනය කරගැනීමට එකඟවී තිබුණත් 2017 අගෝස්තු 09 දින වනවිටත් එම ගොඩනැගිල්ලේම කාර්යාල කටයුතු කරමින් පැවතිණි.

**3.8** **මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**----------------------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 13 | 11 | 02 |
| (ii) | තෘතීයික මට්ටම | 04 | 02 | 02 |
| (iii) | ද්විතීක මට්ටම | 33 | 19 | 14 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 20 | 18 | 02 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 02 | 01 | 01 |
| | **එකතුව** | **72** | **51** | **21** |